# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 178 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 30/01/2024 පැය 1515

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. ගං ඉවුර ඛාදනය වන ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුර.**

2024.01.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අවිස්සාවේල්ල පොලිස් වසමේ කුඩගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කැලණි ගං ඉවුර ඛාදනය වන ලෙස මැණික් ගරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු මැණික් ගැරීමට යොදාගත් උපකරණ ද සමඟ අත්අඩංගුවට ගෙන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 32ත් 42ත් අතර වයස් වල පසුවන අම්තිරිගල හා අවිස්සාවේල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

**02. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුර.**

2024.01.29 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මස්කෙලිය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බගවන්තලාව පොලිස් වසමේ මාඑළිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු මැණික් ගැරීමට යොදාගත් උපකරණ ද සමඟ අත්අඩංගුවට ගෙන බගවන්තලාව පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 26 හා 35 වයස් වල පසුවන බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දෙනියාය කඳවුර.**

2024.01.29 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දෙනියාය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඌරුබොක්ක පොලිස් වසමේ පට්ටිගල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු එම ටිපර් රථයද සමඟ අත්අඩංගුවට ගෙන ඌරුබොක්ක පොලිසිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ඌරුබොක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

ඌරුබොක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**